**කළුතර නගර සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 19 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කළුතර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති 02 ක් සඳහා ගෙවිය යුතු රු.363,041 ක් සඳහා ණය හිමි ප්‍රතිපාදන සලසා නොතිබු අතර තවත් ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් රු.1,462,633 ක් වැඩියෙන් වෙන්කර තිබුණි. | සියළුම ණයහිමි සඳහා වෙන් කිරීම් කල යුතුය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී අඩුවෙන් හෝ වැඩියෙන් මුදල් ඇතුලත් වී නොමැත් බැවින් ඡේදය අවසන් වාර්තාවෙන් ඉවත් කරන මෙන් ඉල්ලමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.564,799 ක් වූ ගිණුම් විෂයන් 02 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.354,450 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන හා අදාල උපලේඛන සන්සන්දනය කර ගිණුම් පිළියෙල කල යුතුය. | මූල්‍ය ප්‍රකාශන හා අදාල උපලේඛන වෙනසක් නොමැති බැවින් ජේදය අවසන් වාර්තාවෙන් ඉවත් කරන ලෙස ඉල්ලමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තොග ලේඛනය හා සමීක්ෂණ වාර්තා නොමැතිවීම නිසා එකතුව රු.6,628,417 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. | මූල්‍ය ප්‍රකාශන වාර්තා ඉදිරිපත් කිරිමේදී වාර්තා පිළියෙල කරතිබූ නමුත් අදාල වාතාවරනය මත ලේඛන විටින් විට ඉදිරිපත් කිරිමට සිදු වීමෙන් වාර්තා ඉදිරිපත් කිරිමේ අපහසුතාවය නිසා මෙම ජේදය ඉවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි. |

1..4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1988 නගර සහා ආඥා පනත 44 වගන්තිය | | සභාව සතු සමස්ථ මාර්ග ප්‍රමාණය ඉදිකළ, ඉදිකිරීමට යෝජිත වශයෙන් හඳුනාගෙන නොතිබුණි. | සභාව සතු සමස්ථ මාර්ග හා ඉදිකල මාර්ග වෙන් වෙන්ව හඳුනාගත යුතුය. | විගණන ජේදය හා එකඟ වෙමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2017 නොවැම්බර් 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | 47,100 | කළුතර නගර සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරු 15 කින් වර්ෂයට අදාල ගාස්තු අය කර නොතිබුණි. | ගැසට් පත්‍රයට අනුකූලව කටයුතු කල යුතුය. . | විගණන ජේදය හා එකඟ වෙමි. |
| (ඇ) | 2008 ජනවාරි 25 දිනැති අංක1533/16 දරන ගැසට් පත්‍රය | - | නිවැරදි සමීක්ෂණයක් සිදු කරමින් පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් පත්‍රයට අනුකූලව කටයුතු කල යුතුය. | විගණන ජේදය හා එකඟ වෙමි. |
| (ඇ) | 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 3(ආ) වගන්තිය | 67,700,000 | වාර්ෂික අයවැය ලේඛනය පදනම් කරගත් ප්‍රමුඛතාවය අනුව ක්‍රියාකාරි සැලැස්ම සකස් කල යුතු වුවද , සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කල ක්‍රියාකාරි සැලැස්ම තුල ක්‍රියාත්මක කිරීමට හඳුනාගත් ව්‍යාපෘති 36 ක් ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කිරීමට 2020 සඳහා අනුමැතිය ලබාගත් අතර ව්‍යාපෘති මහජනතාවගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,870,274 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,567,270 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 27,361,000 | 27,306,936 | 20,790,907 | 18,939,397 | 26,363,000 | 31,407,662 | 19,342,277 | 23,048,163 |
| (ii) | කුලී | 15,530,000 | 14,785,574 | 14,400,994 | 901,612 | 13,665,000 | 11,518,852 | 10,647,589 | 1,152,468 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,001,000 | 1,413,556 | 1,413,556 | - | 2,001,000 | 375,464 | 375,464 | - |
| (iv) | වෙනත් ආදායම් | 45,427,000 | 55,080,434 | 23,649,791 | 50,000,000 | 47,792,000 | 41,090,794 | 41,090,794 | 20,000,000 |
| | | 89,319,000 | 98,586,500 | 60,255,248 | 69,841,009 | 89,821,000 | 84,398,772 | 71,456,124 | 44,200,631 |

### 2.2.2 ආදායම් රැස් කිරිමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වසර 10 කට වඩා පැරණි හිඟ රු.738,258 ක්ද, වසර 05-10 ත් අතර හිඟ රු.1,422,089 ක්ද, වසර 01-05 ත් අතර හිඟ රු.5,233,604ක්ද, වසර 01 ට වඩා අඩු හිඟ රු.5,994,814 ක් විය. | හිඟ ආදායම් අය කළ යුතුවේ. | විගණන ජේදය සඳහා එකඟ වෙමි. |

### 2.2.3 බදුකර කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ රු.78,000 ක් වු බදුකර කුලී හිඟයෙන් වර්ෂය තුල රු.12,200 ක් පමණක් අයකර ගෙන තිබුණි. | බදුකර කුලී කඩිනමින් අය කල යුතුය. | විගණන ජේද සඳහා එකඟතාවය පල කරමි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| ක්‍රියාකාරි සැලැස්මෙන් පරිබාහිරව ඇස්තමේන්තු පිරිවැය රු.29,453,176 ක් වු ව්‍යාපෘති 32 ක් 2019 වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබුණි | ක්‍රියාකාරි සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කර ප්‍රගතිය මිණුම් කළ යුතුය. | එකඟ වෙමි. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | | |
|---|---|---|
| සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගෙන නොතිබුණ අතර කසළ බැහැර කරන ස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි. | කසළ කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් හා පරිසර බලපත්‍රයක් ලබාගත යුතුය. | කසළ බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ඉල්ලීමක් කලද, ඒ සඳහා පිළිතුරු ලබාදී නොමැත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| (i) 2019 තිරසර සංවර්ධන සැලසුම් යටතේ පැළ 100,000 ක් සිටුවීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද එම ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි. තවද, ජංගම වෙළඳුන් සඳහා අත් කරත්ත 20 ක් ලබාදීම සඳහා රු.200,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද ඉන් සියයට 10 ක් පමණක් ඉටුකර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | එකඟතාවය පල කර ඇත. |
| (ii) තිරසර සංවර්ධන ළමා හා මාතෘ සායන වැඩි දියුණු කිරීම යටතේ මවුවරුන් හා දරුවන් 500 ක් ප්‍රතිලාභින් වශයෙන් හඳුනාගෙන අයවැය ඇස්තමේන්තුවෙන් රු.මි.2.4 ක් සමාලෝචිත වර්ෂය තුළ වෙන් කරනු ලැබුවද එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය කොපමණද යන්න තහවුරු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | එකඟ වෙමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සභාවේ ලේකම් තනතුර සඳහා කළමනාකරණ සේවා අධි ශ්‍රේණියේ නිලධාරියෙකු වැඩ බැලීමේ පදනමින් පත්කර තිබුණි. තවද , ගණකාධිකාරි තනතුර පුරප්පාඩුවක් පැවතුණි. | ස්ථිර නිලධාරියෙකු අනුයුක්ත කළ යුතු අතර පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුය. | පුරප්පාඩුව සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත හා ප්‍රධාන ලේකම්වරයා වෙත දන්වා යවා ඇතත්, පුරප්පාඩු පුරවා නොමැත. |
| (ii) ගිනි නිවන බට තනතුරු 05 ක් සහ මෝටර් කාර්මික තනතුරු 06 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු කඩිනමින් පිරවිය යුතුය. | ගිනි බට පුරප්පාඩු 01 ක් හා යාන්ත්‍රික ගිනිබට පුරප්පාඩු 06 ක් අතරින් පුරප්පාඩු 03 සම්පූර්ණ කර ඇත. |

| | | |
|---|---|---|
| (iii) පුස්තකාලයාධිපති තනතුරු දෙකක , තාක්ෂණික නිලධාරි (විදුලි) තනතුරක , කළමනාකරණ සහකාර තනතුරක, ආදායම් පරික්ෂක තනතුරු තුනක හා සෞඛ්‍ය පරිපාලක තනතුරක, රියදුරු තනතුරක, වඩු කාර්මික තනතුරක, කාර්යාල කාර්ය සහායක තනතුරක, මුරකරු තනතුරක, වැඩ කම්කරු තනතුරක හා සෞඛ්‍ය කම්කරු තනතුරු හයක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවිය යුතුය. | පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. |

(ආ) සේවක ණය
--------------

| | | |
|---|---|---|
| සේවය හැර ගිය හා මියගිය නිලධාරින් 57 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.654,799 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිග ණය ශේෂ අයකර ගත යුතුය. | එකඟ වෙමි. |

(ඇ) සේවක ඇප
--------------

| | | |
|---|---|---|
| 2009 වර්ෂයේ සිට සභා සේවකයින්ගෙන් අයකර ගෙන තිබුණ රු.65,965 ක් වූ ඇප තැන්පත් බැංකු ගිණුමක ආයෝජනය කර නොතිබුණි. | සේවක ඇප ආයෝජනය කල යුතුය. | එකඟ වෙමි. |

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකර තිබුණු මාර්ග ප්‍රමාණය මිණුම් කල හා ගැසට් කල මාර්ග තොරතුරු සභාව සතුව නොතිබුණි. | සභාව සතු මාර්ග ප්‍රමාණය මිණුම් කිරීම හා ගැසට් කිරීම් පිළිබඳ තොරතුරු තිබිය යුතුය. | විගණනය හා එකඟ වෙමි. |
| (අ) වර්ෂ 1999 – 2001 කාල සීමාව තුලදී රු.9,514,801 ක වියදමක් දරා ඉදි කර තිබූ කළුතර නගර සභා උද්‍යාන ක්‍රීඩාංගනය නැවත සංවර්ධනය කර ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් 2004 වර්ෂයේදී ගිවිසුමකට එළඹී තිබුණ ද එහි ගිවිසුමේ කාලය දක්වා නොතිබුණි. වසරේ | ගිවිසුම් වලට එලබීමේදී ගිවිසුම් වල නිවැරදිභාවය පිළිබඳ අවධානය යොමු කල යුතුය. | එකඟතාවය පල කරමි. |

දින 183 ක් ක්‍රීඩා කටයුතු සඳහා කුලියට දීමේ හැකියාව සභාව සතු වුවද , ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා 2004 වර්ෂයේ සිට 2020 දක්වා වසර 16 ක කාලයක් එකී ක්‍රීඩාංගනය කුලියට දීමෙන් ලබාගත හැකිව තිබූ ආදායම් සභාවට අහිමි වී තිබුණු අතර ඒ වෙනුවෙන් වසරකට රු.100,000 ක මුදලක් ගිවිසුම්ගත පාර්ශවය විසින් සභාවට ලබා දී තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ දී රු.4,450,000 ක් වැය කර මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කලද , වරිපනම් අංශය හැර සෙසු අංශ 05 හි ස්ථාපිත කරන තිබුණු එම පද්ධතිය වසර 02 ක් ගතවී තිබුණ ද ක්‍රියාකාරි තත්ත්වයට පත් කර නොතිබුණි. | සභාවේ ස්ථාපිත කර තිබූ මෘදුකාංග පද්ධතිය සියළු අංශ සඳහා හැකි ඉක්මනින් ක්‍රියාකාරි තත්ත්වයට පත්කල යුතුය. | මෘදුකාංග පද්ධතිය වරිපනම් අංශයේ සියළු අංශ වෙත හා සියළුම පද්ධති සඳහා ස්ථාපිත කර තිබුණ ද එය ක්‍රියාකාරි තත්ත්වයට පත් කර නොමැත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) පෙරටු කාර්යාලය ස්ථාපිත කිරිම වෙනුවෙන් ලැබී තිබූ පරිගණක උපාංග කට්ටල ගබඩාවේ නිශ්ක්‍රියව තිබුණ අතර පෙරටු කාර්යාලය ස්ථාපිත කිරිමක් ද සිදු කර නොතිබුණි. | සභාව විසින් පෙරටු කාර්යාලය ස්ථාපිත කර පරිගණක ඒ සඳහා භාවිතා කල යුතුය. | පෙරටු කාර්යාලය සඳහා ලද පරිගණක යන්ත්‍ර 01 ක් හැර ඉතිරි සියල්ල වර්ෂයේදී භාවිතා කිරිමට නිකුත් කර ඇත. |
| (ආ) අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් 2015 වර්ෂයේ ලබාදී තිබූ කසල බඳුන් 414 ක් වසර 04 ක් තිස්සේ නිශ්ක්‍රියව පැවතුණි. | නිශ්ක්‍රියව පැවති කසළ බඳුන් භාවිතයට නිකුත් කල යුතුය. | විගණනය හා එකග වන බව |

3.5.2 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) වාහන 03 ක් ලියාපදිංචි කර නොතිබීම හේතුවෙන් වසර කිහිපයක සිට පාවිච්චියට නොගෙන ගාල් කර තිබුණි. | සභාව සතු සියළු වාහන අවශ්‍ය කටයුතු සිදු කර ධාවනය කිරිමට කටයුතු කල යුතුය. | ලියාපදිංචි කර නොමැති වාහන අපහරණය සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ සහය ලබා දෙන ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ඉල්ලීම් කලද , ඒ සඳහා පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) ධාවන තත්ත්වයේ නොපැවති වාහන 07 ක් අළුත්වැඩියා කර ධාවනය කිරිමට හෝ අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | ධාවන තත්ත්වයේ නොපවතින වාහන සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ධාවන තත්ත්වයේ නොමැති වාහන අපහරණය කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරු සහය ලබාදෙන ලෙස පළාත් පාලන කොමසාරිස්ට දන්වා ඇතත් මෙතෙක් පිළිතුරු ලබාදී නොමැත. |

3. 6 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බඩු ගබඩා පාර අළුතින් ඉදිකර තිබුණ වෙළඳපොල ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂයේදී සභාව වෙත පවරා දී තිබුණ ද එය බදු දීමට කටයුතු කර නොතිබුණු අතර හඳුනා ගන්නා ලද බදු කරුවන් 38 කින් ගිවිසුම් අත්සන් කිරිමකින් තොරව රු.719,884 ක මුදලක් 2019 දෙසැම්බර් මාසයේදී ලබාගෙන තිබුණි. | අළුතින් ඉදි කල ගොඩනැගිල්ල විධිමත් ගිවිසුමක් අත්සන් කර බදු දීමට කටයුතු කල යුතුය. | ව්‍යාපාර කටයුතු ආරම්භ කරන තෙක් කඩ කාමර වෙන් කර දී ලද මුදල් තැන්පත් ගිණුමේ රඳවා ඇති අතර තාවකාලිකව ඇති කර තිබුණු ගිවිසුම් සඳහා පසුව විධිමත් ගිවිසුම් අත්සන් කිරීමට තීරණය කර ඇති බව දන්වමි. |

3.7 හඳුනාගත් අලාභ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කටුකුරුන්ද නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 මැයි මාසයේ සිදු වූ සොරකමින් සභාවට වූ රු.115,250 ක අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කල යුතුය. | එකඟ වෙමි. |

| | | |
|---|---|---|
| (ආ) ජාතික තරුණ සේවා සභාව විසින් 2018 දෙසැම්බර් මාසයේ ලබාගත් ජල ටැංකිය බිම වැටීම නිසා සිදු වු රු.20,320 ක් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සිදු වු අලාභය අයකර ගත යුතුය. | එකඟ වෙමි. |

3.8 ප්‍රසම්පාදනය
----------------

3.8.1 ප්‍රසම්පාදන සැලැස්ම
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සෘජු ශ්‍රමය යටතේ ඉදිකර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.15,192,665 ක් වු ව්‍යාපෘති 22 ක් වෙනුවෙන් මිලදී ගන්නා ලද අමුද්‍රව්‍ය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඒ අනුව මිලදී ගැනීම් සිදු කල යුතුය. | 2019 වර්ෂයේදී ප්‍රසම්පාදන සැලැස්මක් හා කාල සටහනක් සකස් කර මිලදී ගැනීම් සිදු නොවුවද , 2020 වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

3.8.2 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

තාර දමා මාර්ග සංවර්ධනය කිරිම
------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අවශ්‍යතාවය හදුනාගෙන මිලදී නොගැනීම නිසා පිරිවැය රු.584,931 ක් කළුගල් කියුබ් 88.765 ක් ඉතිරිව තිබුණි. | ව්‍යාපෘති වෙනුවෙන් සැලසුම් සකස් කර ඒ අනුව මිලදී ගත යුතුය. | තාක්ෂණික නිලධාරින්ගේ ඉල්ලීම පරිදි ගබඩා අංශය විසින් මිලදී ගෙන ඇති අතර නිකුතු නියෝග මගින් ලබාගත් ප්‍රමාණය හැරුණු විට ඉතිරිව ගබඩාවේ පැවති තොගය නිරූපනය වන බව දන්වා ඇත. |
| (ආ)මාර්ගයන් සඳහා දෙවන වර තාර ඇතිරිමෙන් පසු උපදෙස් අනුව වැලි ඇතිරිය යුතු වුවද, ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා වැඩිපුර වැලි කියුබ් 6.5 ක් වෙනුවෙන් සැපයුම් කරුවන් වෙත රු.119,600 ක් ගෙවීම් කර තිබුණි. | අමුද්‍රව්‍ය නිකුත් කිරිමේදී ගබඩා භාරකරුගේ නිකුතු නියෝග මගින් නිකුත් කල යුතුය. | සෘජු ශ්‍රමය යටතේ හා ඉදිකිරිම් සඳහා නිකුතු නියෝග මගින් ද්‍රව්‍ය ලබා දීමෙන් තොරව රැගෙනයාම නිසා මේ තත්ත්වය ඇති වී ඇති අතර පසුව නිකුත් නියෝග ගබඩා තොග ලේඛනයට ඇතුලත් කර ඇත. |